# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1719/28 – 2011 අගෝස්තු 18 වැනි බ්‍රහස්පතින්දා – 2011.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: ATU/LND/04/DO/15.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: LD/05/2008/IR/173.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ සුළු කොට්ඨාසයේ අවසාන ගම් පිඹුරු 58 හි බෝපාගොඩ ගමේ පිහිටි පුවක්වත්ත නමැති ඉඩමෙහි ප්‍රමාණයෙන් හෙක්. 0.0127ක් පමණ වන මාතර මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද මූලික පිඹුරේ කැබලි අංක 81 හි අතිරේක අංක 6හි පත්‍ර අංක 8හි දැක්වෙන පහත මායිම් තුළ වූ ඉඩම් කොටස.

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අංක 13.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ඔක්තෝබර් 12 වැනි දින පෙ.ව. 10.00ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 ඔක්තෝබර් මස 03 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2011 අගෝස්තු මස 01 වන දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 79

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: හාප/සං/2/ඉඅත්/81.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: LD/05/2009/WS/171.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ රජපිහිල්ල ගමේ

1A – G 14947 – 490 (2011/08)

පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2011.07.14 දිනැති අංක මහ 6158 දරන මූලික පිඹුරේ කැබලි අංක 1, 2 හා 4 වශයෙන් දැක්වෙන ''අටලගොඩ හේන'' හා ''කලුහේන කහත්තේ වත්ත"නමැති ඉඩම්වලින් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0175ක් පමණ වන පහත මායිම් තුල වූ ඉඩම් කොටස් තුන (03).

01. කැබලි අංක 1

ඉඩමේ නම: අටලගොඩ හේන; හිමිකම් කියන අය: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර, අංක 226ඒ, රණවන පාර, උඩ බොකලවෙල, පට්ටියවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0053.

උතුරට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන; නැගෙනහිරට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3 සහ 4; බටහිරට: කැබලි අංක 4, ඩී. කුසුමාවතී හිමිකම් කියන කලුහේන කහත්තේ වත්ත සහ එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන.

02. කැබලි අංක 2

ඉඩමේ නම: අටලගොඩ හේන; හිමිකම් කියන අය: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර, අංක 226ඒ, රණවන පාර, උඩ බොකලවෙල, පට්ටියවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0045.

උතුරට: කැබලි අංක 3 සහ එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන; නැගෙනහිරට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ මූ. පි. මහ 3383හි කැබලි අංක 1; දකුණට: මූ. පි. මහ 3383හි කැබලි අංක 1 හා එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන; බටහිරට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ කැබලි අංක 3.

03. කැබලි අංක 4

ඉඩමේ නම: කලුහේන කහත්තේ වත්ත; හිමිකම් කියන අය: ඩී. කුසුමාවතී, උඩ බොකලවෙල, පට්ටියවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0077.

උතුරට: ඩී. කුසුමාවතී හිමිකම් කියන කලුහේන කහත්තේ වත්ත, එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන හා කැබලි අංක 1; නැගෙනහිරට: කැබලි අංක 1 හා කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3 හා මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ ඩී. කුසුමාවතී හිමිකම් කියන කලුහේන කහත්තේ වත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 28 වැනි දින ප.ව. 2.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 සැප්තැම්බර් මස 21 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඒ. පී. ඩබ්ලිව්. ආරියවංශ,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2011 අගෝස්තු මස 15 වන දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුගවෙල.

09 - 97

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: හාප/සං/2/ඉඅත්/79.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/ 2009/WS/170.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ රජපිහිල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2011.07.14 දිනැති අංක මහ 6158 දරන මූලික පිඹුරේ කැබලි අංක 3 වශයෙන් දැක්වෙන ''අටලගොඩ හේන'' නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0167ක් පමණ වන පහත මායිම් තුළ වූ ඉඩම් කොටස.

කැබලි අංක 3

ඉඩමේ නම: අටලගොඩහේන; හිමිකම් කියන අය: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර, අංක 226ඒ, රණවන පාර, උඩ බොකලවෙල, පට්ටියවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0167.

උතුරට: කැබලි අංක 1, එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ පටු මාර්ගය; නැගෙනහිරට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ කැබලි අංක 2; දකුණට: එම්. ඩබ්ලිව්. එස්. සේරසිංහ බණ්ඩාර හිමිකම් කියන අටලගොඩ හේන සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.), කැබලි අංක 4 සහ 1.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් 28 වැනි දින ප.ව. 2.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 සැප්තැම්බර් මස 21 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ඒ. පී. ඩබ්ලිව්. ආරියවංශ,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2011 අගෝස්තු මස 15 වන දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුගවෙල.

09 - 122

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මැ/ආසං/ඉ/1/1/1/11/111.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන
අමාත්‍යාංශයේ අංකය: 03/ජේ/67/68/එල්/503/වීර්.

මොනරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1615/24 හා 2009.08.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වන වගන්තිය යටතේ ශුද්ධි පත්‍රයට අනුව සටහන් වී ඇති අ.ග.පි. 168 අතිරේක අංක 5 අ.ග.පි. 168 අතිරේක අංක 6 ඒ ලෙසට නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කේ. එච්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
මැදගම.

09 - 78

## සංශෝධනයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/2/6/4/1/003.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන
අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2005/එච්ඩබ්ලිව්/604.

ඉහත ශීර්ෂය යටතේ 2010.09.03 අංක 1669/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* මවිසින් පළකරන ලද සංශෝධිත දැන්වීමේ සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් දිනයන් ආදේශ කර එම දැන්වීම පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ යුතු දිනයන් වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2010.10.18 | 2011.09.13 |
| 2010.10.25 | 2011.09.20 |
| 2011.10.26 | 2011.09.22 |

එච්. එම්. එම්. යූ බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2011 අගෝස්තු මස 12 වන දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 96

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.